පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE
372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director — 025 - 2234673
කාර්යාලය / அலுவலகம் / Office — 025 - 2224173
ෆැක්ස් / பெக்ஸ / Fax — 025 - 2224173

මගේ අංකය / எனது இலக்கம் / My No. — NCP/SS/E1/20
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. —
දිනය / திகதி / Date — 2015/10/02

**පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 03/2015**

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරී වෙත,

**නිවුන් දරු ආධාර මාසික ආධාර මුදල වැඩි කිරීම**

පවුලක සිදුවන නිවුන් දරු උපතක් හේතුවෙන් අඩු ආදායම් ලාභී පවුලක මව්පියන්ට එම නිවුන් දරුවන්ට යහපත් ශරීර සෞඛ්‍යය තත්වයක් හා නිසි පෝෂණ තත්ත්වයක් ලබා දීම දුෂ්කර වන අවස්ථාවක එම දරුවන්ගේ පෝෂණය හා රැකවරණය සැළසීම සඳහා සහය වීම වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව යටතේ මාසිකව ගෙවනු ලබන නිවුන් දරු ආධාර මුදල් වැඩි කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව 2015 ජුලි සිට ක්‍රියාත්මක වන පරිදි, මේ වන විට ගෙවනු ලැබූ නිවුන් දරු ආධාර මුදල පහත පරිදි වැඩි කිරීමට තීරණය කර ඇත.

| අනු අංකය | දැනට ගෙවනු ලබන මුදල | සංශෝධිත ආධාර මුදල | ගෙවනු ලබන ආකාරය |
|---|---|---|---|
| 01 | නිවුන් දරු උපතක් සඳහා මාසිකව රු. 700.00 | නිවුන් දරු උපතක් සඳහා මාසිකව රු. 1,000.00 | දරුවන්ට වයස අවුරුදු තුන වන තෙක් මාසිකව |
| 02 | තුන් නිවුන් දරු හෝ ඊට වැඩි දරු උපතක් සඳහා මාසිකව රු. 1,000.00 | තුන් නිවුන් දරු හෝ ඊට වැඩි දරු උපතක් සඳහා මාසිකව රු. 1,500.00 | |

03. ඒ අනුව 2015 ඔක්තෝබර් සිට මාසික නිවුන් දරු ආධාර මුදල ඉහත පරිදි වැඩිකර ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද මේ වන විට රු. 700.00 හෝ 1000.00 බැගින් 2015 ජුලි, අගෝස්තු, සැප්තැම්බර් මාස සඳහා ආධාර මුදල් ගෙවා ඇති ආධාර ලාභීන් සඳහාද ගෙවිය යුතු හිඟ මුදල් 2015 ඔක්තෝබර් මස ආධාර මුදල් ගෙවීමේ දී ගෙවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. මාසික ආධාර මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුව වෙතින් අයදුම් කිරීමේදී ඉහත හිඟ ගෙවීම් සඳහාද ප්‍රතිපාදන අයදුම් කළ යුතු අතර, එම ඉල්ලීම් අනුව ප්‍රතිපාදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

05. උතුරු මැද පළාත් සභාවේ 2015/08 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/36 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.